**ජාතික ඖෂධ නියාමන අධිකාරිය - 2017**

**-------------------------------------------------**

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහාවූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 20 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ හා 2018 ඔක්තෝබර් 15 දින අධිකාරියේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලද ගනුදෙනු පිළිබඳ වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම** -----

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

------------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 තත්ත්වාගණනයකළ මතය සඳහා පදනම**

------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1

(i) ප්‍රමිතයේ 113 ඡේදය ප්‍රකාරව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇතුළත් ඉන්වෙන්ට්‍රි, කෙටිකාලීන ආයෝජන, ආදායම් බදු ප්‍රතිපාදනය, ගෙවිය යුතු එකතු කළ අගය මත බදු, ගෙවිය යුතු මුද්දර බදු, භාණ්ඩාගාර ප්‍රේෂණ සඳහා ප්‍රතිපාදන සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි ඇතුළත් පොලී ආදායම හා වෙනත් ආදායම් යන අයිතමයන් සඳහා සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 117 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන අවබෝධ කරගැනීමට අවශ්‍ය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හෙළිදරව් කළ යුතු වුවද, අධිකාරිය විසින් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු (Related party transaction) පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20

ප්‍රමිතයේ 31 ඡේදය ප්‍රකාරව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා රාජ්‍ය ප්‍රදාන ලැබී නොතිබීම පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ඉදිරි වර්ෂ වෙනුවෙන් ලැබී තිබුණු රසායනාගාර පරීක්ෂණ ගාස්තු රු.2,913,051 ක් සහ බලපත්‍ර ගාස්තු රු.217,672 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස සලකා ගිණුම් ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ඖෂධ ලියාපදිංචි කිරීමේ ආදායම රු.3,078,000 කින් හා වෛද්‍ය උපකරණ පෙරසැරි ගාස්තු ආදායම රු.489,846 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ආදායම් බද්ද හා 2017 දෙසැම්බර් 31 දිනට බදු වගකීම රු.2,723,519 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාළව 2018 වර්ෂයේදී ගෙවා තිබුණු එකතු කළ අගය මත බදු වටිනාකම රු.106,949,434 ක් වුවද, 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම රු.105,462,594 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට සහ සමාලෝචිත වර්ෂයට අදාළව 2018 වර්ෂයේදී ගෙවා තිබුණු මුද්දර ගාස්තු රු.31,201,280 ක් වුවද, 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුද්දර ගාස්තු වටිනාකම රු.36,111,233 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**2.2.3 නොසැසඳූ පාලන ගිණුම්**

වෛද්‍ය උපකරණ ආනයනය කිරීමේ ගාස්තු ආදායම් හා යහපත් නිෂ්පාදන පරිචය පරීක්ෂා කිරීමේ ගාස්තු (දේශීය) ආදායම්වල මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම් සහ උපලේඛන අනුව වටිනාකම් අතර පිළිවෙලින් රු.310,800 ක සහ රු.46,473 ක වෙනසක් පැවතුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**-------------------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව අත්තිකාරම් ලැබීම් රු.85,643,656 ක වටිනාකම තහවුරු කරගැනීම සඳහා උපලේඛන හා කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් නොවූ බැවින් විගණනයේදී එම වටිනාකම තහවුරු කරගත නොහැකි විය.

**2.2.5 වත්කම් ගිණුම්ගත නොකිරීම**

**------------------------------------**

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවති ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය සතුව පැවති වත්කම් 2019 මැයි 31 දින වන විටත් ගිණුම්වලට ගෙන නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**-------------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.288,823,697 ක ලාභයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.57,557,675 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.231,266,022 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ලියාපදිංචි ආදායම සියයට 385 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 ප්‍රධාන වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

**-----------------------------------------------------------------**

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම පිළිවෙලින් රු.25,497,060 ක් හා රු.60,759,242 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 138 කින් වැඩිවී තිබුණි. විදේශ ගමන් වියදම සියයට 2516 කින් වැඩිවී තිබීම සහ යහපත් නිෂ්පාදන පරිචය පරීක්ෂා කිරීමේ වියදම සියයට 1635 කින් වැඩිවී තිබීම ඊට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.